# <u>ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කිරීම සඳහා උපදෙස්</u>

**අයදුම්පත් භාරගැනීම පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා** **දු.ක. 011 2738152**

**ඔබගේ අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර පහත උපදෙස් කියවන්න**

ව්‍යාපාර නාමය අනුමත කරනු ලබන්නේ ප්‍රාදේශීය ලේකම් විසිනි.

ව්‍යාපාර නාම ලියාපදිංචි අයදුම්පතේ පසුපිටෙහි ඇති උපදෙස් ද බලන්න. **(අයදුම්පත ඉංග්‍රිසි මාධ්‍යයෙන් පමණක් සම්පූර්ණ කරන්න)**

- තනි පුද්ගල ව්‍යාපාර නාම ඉල්ලුම් පත්‍රය (බ.ප.) ආර්.1 ආකෘති පත්‍රය
- හවුල් ව්‍යාපාර නාම ඉල්ලුම් පත්‍රය (බ.ප.) ආර්.2 ආකෘති පත්‍රය

**1.** ග්‍රාම නිලධාරී වාර්තාව

- මෙය අදාළ ඉල්ලුම්පත්‍රය සමඟ නිකුත් කරනු ලැබේ.
- **ව්‍යාපාර ස්ථානයට** අදාළ වසම භාර ග්‍රාම නිලධාරී විසින් අත්සන් කර තිබීම අනිවාර්ය වේ.
- අදාළ ග්‍රාම නිලධාරී වාර්තාවේ කපාහැරීම, මැකීම ,මකන දියර භාවිතා කිරීම් සිදුකර ඇත්නම් **එකී ස්ථාන ග්‍රාම නිලධාරී විසින්** සිය අත්සන යොදා නිල මුද්‍රාව තැබිය යුතුය.
- <u>**වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක නම් පදිංචිකරුවෙක් නම් පදිංචි සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.**</u>

**2.** ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත

- **ග්‍රාම නිලධාරී/සාමවිනිසුරු/දිවුරුම් කොමසාරිස් වරයෙකු විසින් සහතික කර තිබිය යුතුය.**
- ඉල්ලුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය. ද්විත්ව පුරවැසිභාවය දරන්නේ නම් සනාථ කළ යුතු ලියවිලි ඉදිරිපත් කළ යුතුය.
- විදේශ ගමන් බලපත්‍ර/රියදුරු බලපත්‍ර ඉදිරිපත් කළ හැක්කේ ජාතික හැඳුනුම්පත **අපහැදිලි අවස්ථාවලදී** එය තහවුරු කිරීම සඳහා පමණි
- ජාතික හැඳුනුම්පත **අස්ථානගතවී ඇත්නම්** එකී පුද්ගලයාගේ පදිංචි වසමේ පොලිස් ස්ථානාධිපති වෙතින් ලබාගත් පොලිස් වාර්තාව ඉදිරිපත් කළ යුතුය.
- ජාතික හැඳුනුම්පත නැවත ලබා ගැනීම සඳහා **පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇත්නම්** ඒ බව සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරී විසින් සහතික කර නිකුත් කරන ලද **කුවිතාන්සිය** ඉදිරිපත් කළ යුතුය.

**3.** අදාළ ව්‍යාපාර ස්ථානය තහවුරු කිරීම

- **තමාට අයත් වන්නේනම්,** ඉඩම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද ඔප්පුවේ මුල් පිටපත සමඟ **නොතාරිස් වරයෙකු විසින් සියළුම පිටු සහතික සහතික කරන ලද** ඔප්පුවේ ඡායාස්ථ පිටපතක් ඉදිරිපත් කළ යුතුය. ජීවිත භුක්තිය පවතින අවස්ථාවක ජීවිත භුක්ති කරුගේ කැමැත්ත **දිවුරුම් ප්‍රකාශයකින්** ලබාදිය යුතුය.එමෙන්ම එම අයගේ **සහතික කරන ලද ජාතික හැඳුනුම්පත්** පිටපතක්ද ලබා දිය යුතුය.
- **බදු/කුලී ගිවිසුමක් යටතේ පවත්වාගෙන යන්නේ නම්,** ඉඩම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද ගිවිසුමේ මුල් පිටපත සමග **නොතාරිස් වරයෙකු විසින් සත්‍ය පිටපතක් බවට සියළුම පිටු සහතික කරන ලද ගිවිසුමේ** ඡායාස්ථ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.
- **බදු/කුලී ගිවිසුම අයිතිකරුගේ සහතික කරන ලද ජාතික හැඳුනුම්පත්**/ විදේශ ගමන්බලපත්‍රයේ/රියදුරු බලපත්‍රයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.බදු අයිතිකරු සමාගම් වන අවස්ථාවල එම සමාගමෙන් සහතික කරන ලද ලියාපදිංචි සහතික පිටපත ඉදිරිපත් කළ යුතුය.
- **ව්‍යාපාර ස්ථානයට අදාළ ඔප්පුව යම් බැංකුවක්/මූල්‍ය ආයතනයක් වෙත උකස් කර ඇත්නම්** එකී දේපල තුළ ව්‍යාපාරය ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් විරෝධතා නොමැති බවට අදාළ ආයතනයෙන් ලබා ගත් ලිපිය හා එම ආයතනය විසින් සහතික කරනු ලැබූ ඔප්පුවේ ඡායාස්ථ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.
- **යම් ව්‍යාපාර ස්ථානය අයිතිකරුගේ කැමැත්ත මත පමණක් පත්වාගෙන යන්නේනම් අදාල ඔප්පුවේ සහතික පිටපතට** අමතරව එකී ව්‍යාපාර ස්ථානයේ අයිතිකරුවන් වෙතින් ව්‍යාපාරය සඳහා **විරුද්ධත්වයක් නොමැති බවට දිවුරුම් ප්‍රකාශයක්** සහ එකී අයිතිකරුවන්ගේ ජාතික හැඳුනුම්පත/විදේශ ගමන්බලපත්‍රය/රියදුරු බලපත්‍රයේ සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.
- **ව්‍යාපාරික ස්ථානයේ හිමිකම ඥාතියෙකු සතු වන්නේ නම්** එම ඥාතිත්වය තහවුරු කිරීම සඳහා අවශ්‍ය උප්පැන්න සහතික/විවාහ සහතිකක යනාදි ලේඛන වල සහතික කල පිටපත්

**04.** අදාල වර්ෂයේ වරිපනම් බදු තක්සේරු දැන්වීමේ සහතික කල පිටපතක්

**05.** ආරම්භක ප්‍රාග්ධන මුදල සනාථ කර ව්‍යාපාරිකයා විසින් විධිමත් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුයි. (හවුල් ව්‍යාපාරයකදී මෙම දිවුරුම් ප්‍රකාශය අයදුම්පත්‍රයේ මුලින් නම සඳහන් කරන හවුල්කරු විසින් ඉදිරිපත් කළ යුතුය)

**06.** දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාවට වෙළඳ බදු මුදල ගෙවා ලබා ගත් කුවිතාන්සියේ පිටපතක් ඉදිරිපත් කළ යුතුයි.

**07.** හවුල් ව්‍යාපාර සඳහා තමා ව්‍යාපාරයේ හවුල්කරුවෙකු බව ප්‍රකාශ කරන දිව්රුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුයි.

**08.** හවුල් ව්‍යාපාර ගිවිසුමක් ඇතොත් එහි සහතික කල පිටපතක් ඉදිරිපත් කළ යුතුයි.

**09.** ව්‍යාපාරය හිමිකරුගේ හෝ ව්‍යාපාර ස්ථානය හිමිකරුගේ නම් වල වෙනස්කම් පවතී නම් ඒ සඳහා විධිමත් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.

**ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කිරීම කිරීම සඳහා පහත පරිදි ගාස්තු අය කෙරේ.**

ප්‍රාග්ධන ආයෝජනය රු. 299,999/= දක්වා වන ව්‍යාපාර සඳහා රු. 1,500/=
ප්‍රාග්ධන ආයෝජනය රු. 300,000/= සිට රු.499,999/= දක්වා වන ව්‍යාපාර සඳහා රු. 2,500/=
ප්‍රාග්ධන ආයෝජනය රු. 500,000/= ට වැඩි ව්‍යාපාර සඳහා රු. 3,500/=

- ව්‍යාපාරයක් ආරම්භකර දින 14 තුළ හෝ ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩදෙනු ලබන කාලසීමාවක් ඇතුළත (දින 30ක් දක්වා සහන කාලයක් දෙනු ලැබේ) ලියාපදිංචිය සිදු කළ යුතු අතර නියමිත කාලය ඉකුත් වී ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් තීරණය කරනු ලබන ප්‍රමාද ගාස්තුවක් අයකරනු ලැබේ. තවද **රජයේ වැඩකරන දින 14ක් ඇතුළත** ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකය ඔබහට ලබා දීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන ඉහත ලියවිලි වලට අමතරව වෙනත් ලියවිලි ද කැඳවිය හැක. (සියලුම ජායා පිටපත් සහතික කර ආයුතු වේ.)

**ප්‍රාදේශීය ලේකම් විසින් අවස්ථානුකූලව කැඳවනු ලබන වෙනත් ලේඛන**

- යම් ව්‍යාපාරයක් ආයුර්වේද සම්බන්ධ බෙහෙත් ශාලා /රෝහල්/ චිකිත්සා ආයතන/ඔසුහල් ඖෂධ ගබඩා/ පැල තවාන් ඒ හා සම්බන්ධ ව්‍යාපාරයක් නම් **පළාත් ආයුර්වේද කොමසාරිස්ගේ** එකඟතාවය තිබිය යුතුයි.
- ආහාර පාන සම්බන්ධ ව්‍යාපාර කටයුතු සඳහා මහජන **සෞඛ්‍ය පරිකෂකගේ** වාර්තාව
- මැණික් හා ස්වාර්ණාභරණ අලෙවිය /නිෂ්පාදන සම්බන්ධ ව්‍යාපාරයක් නම් ව්‍යාපාර හිමිකරුගේ පෞද්ගලික නමට නිකුත් කරන ලද **ජාතික මැණික් හා ස්වාර්ණාභරණ අධිකාරියේ නිර්දේශය** සහිතව යොමු කළ යුතුය.
- ව්‍යාපාරයට අදාල වෘත්තීය සුදුසුකම් ලබාගත යුතු යැයි හැගෙන අවස්ථාවල එකී වෘත්තීය සුදුසුකම් සනාථ කරන සහතික පිටපත් ලබාදිය යුතුය .
- සිගරට්,පයිප්ප, දුම්කොළ,සුරුට්ටු,බීඩි සඳහා වන අමුද්‍රව්‍ය/නිමිභාණ්ඩ නිෂ්පාදනය /ගබඩා කිරීම/ආනයන/අපනයන සඳහා **සුරාබදු කොමසාරිස් ජනාරාල්ගේ එකගතාවය** සහිතව යොමු කළ යුතුය.
- ඖෂධ ශාලා සඳහා ඖෂධ නියාමන අධිකාරියේ එකඟතාවය හා ඖෂධවේදීන් සඳහා **ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි** සහතිකය.
- පෙරපාසල් සඳහා බස්නාහිර පළාත් **පෙර පාසල් අධ්‍යක්ෂකගේ නිර්දේශය** අවශ්‍ය වේ.
- දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු **මුල් ළමා විය සංවර්ධන සහකාරගේ** නිර්දේශය ලබාගත යුතුය.
- රූපලාවන්‍යාගාර,වෛද්‍ය මධ්‍යස්ථාන ,සුවඳ විලවුන් වර්ග අලෙවිය **- පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නිර්දේශය/ මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ** නිර්දේශය සහ වෘත්තීය සුදුසුකම් සනාථ කරන සහතික අවශ්‍ය වේ.
- ඉන්ධන පිරවුම්හල් **- මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශය සහ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ එකඟතාවය** අවශ්‍ය වේ.
- පොලිතීන්/ ප්ලාස්ටික්/ තීන්ත වර්ග ඇසිඩ් නිෂ්පාදන ගබඩාකර තැබීම් ,අලෙවිය හා ඒ ආශ්‍රිත වෙනත් කර්මාන්ත සඳහා **මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශය** අවශ්‍ය වේ .
- දැව ආශ්‍රිත කර්මාන්ත, දැව කැපීම් ,දැව ප්‍රවාහන සඳහා වන **සංරක්ෂණ දෙපාරත්මේන්තුවේ එකඟතාවය** අවශ්‍ය වේ.
- මුද්‍රනාල ලියාපදිංචිය සඳහා **ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ** නිර්දේශය අවශ්‍ය වේ.
- ශ්‍රමිකයන් සපයන ආයතන සඳහා අයිති කරුවන් නමින් ලබාගත් **පොලිස් නිෂ්කාශන වාර්තාව** අවශ්‍ය වේ.
- කාමර/නවාතැන් පහසුකම් සැපයීම,සම්භාහන(ස්පා) මධ්‍යස්ථාන/ගෙස්ට් හවුස් වැනි ව්‍යාපාරය සඳහා අදාළ ස්ථානය සහ අයිතිකරුවන් පිළිබඳ ප්‍රදේශයේ පොලිස් ස්ථානයෙන් ලබාගත් **පොලිස් වාර්තාව සහ මහජන විරොධතා නොමැති බවට ග්‍රාම නිලධාරී වෙතින් ලබා ගත් වාර්තාව**
- සත්ත්ව ගොවිපළවල් සඳහා **පශු වෛද්‍ය නිලධාරීගේ නිර්දේශය.**
- පලිබෝධක /කෘමිනාශක /රසායනික පොහොර අලෙවි සැල් සඳහා **කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනාරල්ගේ** නිර්දේශය.
- යම් වෙළඳ නියෝජිතයෙකු ලෙස කටයුතු කරන්නේ නම් එම **ආයතනයේ නියෝජිත ලෙස පත්කර ඇති බවට ලිපිය.**